**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - 2023**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි 02 කට තෙකලා විදුලි සම්බන්ධතාවය ලබාගැනීම සඳහා 2022 වර්ෂයේදී විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණු රු.4,098,592 ක් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 22 ඡේදයට පටහැනිව එම වර්ෂයේදී පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීමේ දෝෂය සමාලෝචිත වර්ෂය තුළදී අතීතානුයෝගීව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | විදුලි බල මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලද විදුලි රැහැන් පද්ධතිය විදුලි බල මණ්ඩලය සතු වත්කමක් නිසා ඒ සඳහා ගෙවන ලද සේවා ගාස්තුව පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලසීමාව තුල උසස් අධ්‍යාපන ප්‍රවේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් (AHEAD) ගොඩනැගිලි හා උපකරණ මිලදී ගැනීම සඳහා හා වැටුප්, දීමනා හා අනෙකුත් වියදම් ගෙවීම සඳහා ලැබී තිබුණු රු.241,336,414 ක් ගිණුම්ගතකර නොතිබුණි. | පශ්චාත් උපාධි පාඨමාලා, වැටුප් හා දීමනා, ගොඩනැගිලි සහ රසායනාගාර වියදම් ඇතුළු සියලු වියදම් AHEAD ව්‍යාපෘතියේ ගිණුම් වල සඳහන් වී ඇති බව. | විශ්වවිද්‍යාලයේ සියළු ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු ශිෂ්‍ය ආදායම නිවැරදිව හඳුනාගැනීමකින් තොරව ශිෂ්‍ය ආදායම් පාලන ගිණුමේ ශේෂය හා හඳුනානොගත් ශිෂ්‍ය ආදායම් ගිණුමේ ශේෂය අතර රු.801,136,623 ක වෙනස ලැබිය යුතු ශිෂ්‍ය ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එහි කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් කර නොතිබුණි. | OMIS පරිගණක පද්ධතියේ පවතින අපහසුතා හේතුවෙන් ශිෂ්‍ය ආදායමට අදාළව නිවැරදි කාල විශ්ලේෂණයක් ලබා ගැනීමට නොහැකි වී ඇත. නව පරිගණක පද්ධතිය මගින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී බලාපොරොත්තු වන බව. | ලැබිය යුතු ශිෂ්‍ය ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා කාල විශ්ලේෂණ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.13,382,583 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදීගත් දිනයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්‍රමක්ෂය කර නොතිබුණි. | E-books හා මෘදුකාංග (Software) වල ජීවිත කාලය පුරෝකථනය කල නොහැකි බැවින් එම වත්කම් අවිනිශ්චිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කර ඇති බව. | අස්පෘශ්‍ය වත්කම් වල ඵලදායී ජීව කාලය පිළිබඳ සාධාරණ තක්සේරුවක් සිදු කර ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අධ්‍යයන මෙවලම් (Course Materials) තොගයේ වටිනාකම රු.123,405,203 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | තොග සමීක්ෂණ මණ්ඩල විසින් අධ්‍යයන මෙවලම් තොගය පිරිවැයට ආගණනය කරන ලද අතර, එම වියදම ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇති බව. | අවසන් තොග වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් ගබඩාවට ලැබී තිබුණු පිරිවැය රු.5,976,835 ක් වූ ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග ගිණුම්ගත කර නොතිබුණි. | 2023 දෙසැම්බර් මස අවසානයේදී ලිපි ද්‍රව්‍ය හා පරිගණක උපාංග තොගයක් ගබඩාවට ලැබුණ ද, ඊට අදාළ ඉන්වොයිස්පත් 2024 වර්ෂයේදී ලැබී ඇති බැවින් ඒවා 2024 වර්ෂයේදී ඉන්වෙන්ට්‍රිගත කිරීමට සිදු වූ බව. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂයට අදාළ උපචිත වියදම් රු.27,962,527ක් සමාලෝචිත වර්ෂයේ වියදම්වලින් අඩුකර දක්වා තිබුණු අතර, 2021 වර්ෂයට අදාළ උපචිත වියදම් රු.30,282,945ක් 2022 වර්ෂයේ වියදමින් අඩුකර දක්වා තිබුණි. එහෙත් ඊට අදාළ ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.191,982,135 ක් වූ උපචිත වියදම් ශේෂය සඳහා කාලවිශ්ලේෂණයක් ද ඉදිරිපත් නොකෙරුණි. | 2022 වසරට අදාළව උපචිත වියදම් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී එම වියදම උපචිත වියදම් ගිණුමට හර කිරීම වෙනුවට අදාළ වියදම් ගිණුමට හර කර තිබීම නිවැරදි කිරීමට 2023 වර්ෂයේ අදාළ වියදම් ගිණුමෙන් අඩු කිරීමට කටයුතු කළ බව. | විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි හා කාලවිශ්ලේෂණ ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ එකතු කල අගය මත බදු(VAT) ඉන්වොයිස්පත් ඉදිරිපත් නොකරන ලද කොන්ත්‍රාත්කරුවන්ට හා සැපයුම්කරුවන්ට ගෙවිය යුතු එකතු කල අගය මත බදු (VAT) වියදම් ලෙස එකතුව රු.14,023,270ක් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ගෙවිය යුතු බදු වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | වලංගු වැට් බදු නිශ්කාෂණ සහතිකයක් ඉදිරිපත් නොකරන ලද සැපයුම් කරුවන්ගේ වැට් බදු මුදල් එම නිශ්කාෂණ සහතිකය ලැබෙන තුරු රඳවා ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර ඇති බව. | අදාළ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී වැට් ඉන්වොයිසි ඉදිරිපත් නොකරන සැපයුම්කරුවන් වෙත වැට් බදු නොගෙවිය යුතුය. |
| (ඊ) | අක්කර 34 ක භූමි භාගයක් තුළ පිහිටි විවෘත විශ්වවිද්‍යාලයේ පවතින අභ්‍යන්තර මාර්ග පද්ධතිය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැඟිලි ප්‍රත්‍යාගණනය රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අතර විශ්වවිද්‍යාලයේ පවතින අභ්‍යන්තර මාර්ග පද්ධතිය සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන එම තක්සේරුව සිදුකර ඇතැයි විශ්වාස කරන බව. | ඉඩම් හා ගොඩනැඟිලි වටිනාකම තුළ අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඇතුළත්ව තිබේද යන්න තහවුරු කරගෙන මූල්‍ය ප්‍රකාශන තුළ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් වෙන්කර දැක්විය යුතුය. |
| (උ) | 2019 දෙසැම්බර් සිට 2023 ජූනි දක්වා Curriculum Development on Europe Sri Lanka Capacity Building in Energy Circular Economy මගින් විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබූ එකතුව රු.175,405,241ක් හා ඉන් දරන ලද වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | ERASMUS+CBHE ව්‍යාපෘතිය විශ්වවිද්‍යාලයේ ගිණුම් වලින් පරිබාහිරව වෙනමම ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් නිසා එම ව්‍යාපෘතියේ බැංකු ගිණුම් ශේෂය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් නොමැති බව. | විශ්වවිද්‍යාලයේ සියළු ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කළ යුතුය. |

## 1.6 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11(අ) , 9(2)(ඊ) හා 10(5)(1) වගන්ති | අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.2,238,763,138ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය ලැබෙන තුරු කෙටිකාලීන ආයෝජන ප්‍රමාද කළ නොහැකි බැවින් ස්ථාවර තැන්පතු වල අයෝජනය කරන අවස්ථාවේදීම භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලා ලිපි යොමුකර ඇති බව. | මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 102, 103, 104, හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය , 2023 මැයි 16 දිනැති අංක PED/01/2021 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා එකතුව රු.39,122,656 ක් වූ හානි වූ හා යල් පැනගිය අධ්‍යයන ද්‍රව්‍ය (Course materials) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය විසින් කපාහැරීමට අනුමැතිය ලබාදී තිබුණි. | විශ්වවිද්‍යාලය විසින් වාර්ෂිකව ලියාපදිංචි වන ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන අධ්‍යයන ප්‍රකාශන මුද්‍රණය කරනු ලබයි. නමුත් අධ්‍යයන වර්ෂ අතරතුර සිසුන් විසින් පාඨමාලා හැරයාම, විෂය නිර්දේශයන් වෙනස්වීම් ආදී කරුණු හේතුවෙන් ඇතැම් විට මුද්‍රණය කරන ලද පොත්පත් ඉවත් කිරීමට සිදුවන බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු අතර අධ්‍යයන ප්‍රකාශන මුද්‍රණය කිරීමේදී පාඩු අවම වන පරිදි වියදම් දැරීම සිදු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 570,571 හා 572 | එකතු වටිනාකම රු55,295,904.ක් වූ කල් ඉකුත් වූ රැඳවුම් ,ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ නියාදනය කර නොතිබුණි. එමෙන්ම, මුද්‍රණාලයේ වැඩ සඳහා 2013 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ලබාගෙන තිබුණු රු.1, 204,594 ක් නිරවුල් කර නොතිබුණි. | ලංසු සුරක්ෂණ හැකි ඉක්මනින් නිදහස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව හා මුද්‍රණාලයේ අදාළ වැඩ නිමකර ඇති බැවින් එම ආදායම මෙම වසරේදී බෙදාහැර හැකි ඉක්මනින් ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 756 | වටිනාකම රු.332,601,124 ක් වූ පුස්තකාල පොත් තොගය හා පිරිවැය රු.85,538,631 ක් වූ ප්‍රාදේශීය මධ්‍යස්ථාන 27 ක පාඨමාලා ද්‍රව්‍ය, ඇදීම් උපකරණ හා අනෙකුත් තොග සමීක්ෂණය කර නොතිබුණි. | 2019 වර්ෂයේදී සමීක්ෂණයක් සිදුකර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.5 හා 2020 මාර්තු 25 දිනැති අතිරේක 35 | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු(සුළු) සීමාව ඉක්මවීම වැළැක්වීමේ අරමුණින් එකතුව | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.182,544,563ක් වූ ගොඩනැගිලි නවීකරණ ප්‍රසම්පාදන කාර්යයන් 03ක් අදියර 2ක් හා අදියර 3ක් ලෙස කොටස්කර 2023 වර්ෂයේ එකම කාලසීමාවක් තුළ ආරම්භ කර ප්‍රසම්පාදනය කර තිබුණි. | | |
| (ඈ) | 2013 ජනවාරි 31 දිනැති අංක 02/2013 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 වගන්තිය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව උපරිමය රු500.,000ක ණය කාඩ්පතක්) Credit Card) 2021 වර්ෂයේ සිට ආරම්භ කර ගනුදෙනු කරමින් පැවතුණි. | භාණ්ඩාගාර අනුමැතිය සඳහා මේ වන විටත් ලිපි යොමු කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2023 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.2,043,340,394ක් වූ දේපල පිරියත උපකරණ සහ පිරිවැය රු.18,780,970 ක් වූ අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | OMIS පරිගණක පද්ධතියේ ස්ථාවර වත්කම් මොඩියුලය නිවැරදි කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රෙල්ඛය | විශ්වවිද්‍යාලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රජයේ අරමුදල් හා සේවක දායකය ලෙස පිළිවෙලින් රු.44,000,000 ක් හා රු.39,872,693 ක් යොදවා විශ්වවිද්‍යාලය තුළ පිහිටුවන ලද රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ගෙවිය යුතු රක්ෂණ ගිණුමක් හරහා අභ්‍යන්තරිකව පත්කළ කමිටුවක නිර්දේශ මත සේවක රක්ෂණ ඉල්ලුම්පත්‍ර වෙනුවෙන් රු.82,511,730 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල පනත සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 718 අනුව විවෘත විශ්වවිද්‍යාලය තුළ වෛද්‍ය සුභ සාධන යෝජනා ක්‍රමයක් උත්පාදිත ආදායම සහ සේවක දායකත්ව අරමුදලක් සහිතව පවත්වාගෙන යා හැකි බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලද උපදෙස් මත පවත්වා ගෙන යනු ලබන බව. | රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය | 1989 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලසීමාව තුළ බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද නිලධාරීන් 39 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.177,019,582 ක් 2023 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගෙන නොතිබුණි. | නිලධාරීන් 06 දෙනෙකුට නඩු පවරා ඇත. එසේම ලිපිනය සොයාගැනීමට නොහැකි නිලධාරීන් 12 දෙනෙකු ද වාරික වශයෙන් අයකරන 07 දෙනෙකුද බැඳුම්කර කඩකර වසර දහය ඉක්මවා ඇති නිලධාරීන් පිළිබඳව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | බැඳුම්කර කඩකිරීම හේතුවෙන් රජයට අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/ 19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපියේ 05 ඡේදය | බැඳුම්කර හා ගිවිසුම් කඩවීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණු රු.26,187,720 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතුකර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 737 මගින් සඳහන් කර ඇති විධිවිධාන අනුව විශ්වවිද්‍යාලය කටයුතු කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (එ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 347 දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.1,734,782,688 ක් ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහයේ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන සලසා තිබුණ ද අධ්‍යයන කාර්යය මණ්ඩලය පැමිණීම පිටවීම සටහන් නොකරන බව. | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2020 අගෝස්තු 14 දිනැති අංක SC & PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විදේශ සම්පත් දෙපාර්තුමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබාගැනිමෙන් තොරව, 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල දි පර්යේෂණ සඳහා රු.25,719,472 ක විදේශ ප්‍රදාන 5ක් සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා විදේශ ප්‍රදාන රු.193,888,967 ක් පුද්ගලයින්ගෙන් හා ආයතන මගින් විවෘත විශ්වවිද්‍යාලය සෘජුවම ලබාගෙන තිබුණි . | එවිදේශ ආයතන හා ආචාර්යවරුන් අතර අරමුදල් හුවමාරුවේදී අතරමැදි ආයතනයක් ලෙස පමණක් විශ්වවිද්‍යාලය කටයුතු කර ඇති බව. එබැවින් සඳහන් කර ඇති චක්‍රලේඛයේ විෂය පථයට ඒවා අදාළ නොවන බව . | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | 2020 අගෝස්තු 24 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 04 (III) ඡේදය | නියමිත පර්යේෂණ අධීක්ෂණ කමිටුවට ඉදිරිපත් කර එම කමිටුවේ එකඟතාවය ලබාගැනීමෙන් තොරව අවසන් පර්යේෂණ වාර්තාව ඉදිරිපත් කිරීම පදනම් කරගනිමින් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ අංශයේ හා මානව හා සමාජ විද්‍යා පීඨයේ පිළිවෙලින් නිලධාරීන් 113 දෙනෙකු හා 281 දෙනෙකු වෙත 2018-2022 කාලය තුළ පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.753,979,584ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.617,359,771 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.136,619,813 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන, ශිෂ්‍ය ආදායම් හා කෙටිකාලීන පාඨමාලා ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 129 දෙනෙකු සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 269 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී පමණක් රු.137,402,969 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණි. තවද තාවකාලික පදනම මත අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 21 දෙනෙකුද බඳවාගෙන දීමනා ගෙවා තිබුණි. | රජය විසින් තාවකාලිකව කාර්යය මණ්ඩල බඳවා ගැනීම අත්හිටුවීමත් සමගම විවෘත විශ්වවිද්‍යාලයේ දෛනික අධ්‍යයන හා පරිපාලන කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා අධ්‍යන හා අනධ්‍යන කාර්යය මණ්ඩලය තාවකාලික පදනම යටතේ බඳවා ගැනීම් සිදුකර ඇති බව. | කාර්යමණ්ඩල බඳවාගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. . |

| | | | |
|---|---|---|---|
| (ආ) | උසස් අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (AHEAD) ප්‍රතිපාදන යටතේ රු.5,234,000 ක් වැයකර 2023 අප්‍රේල් 28 දින වනවිට වැඩ අවසන් කරන ලද ජංගම රසායනාගාර බස්රථය සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ඌන උපයෝජිතව පැවතුණි. | එම බස්රථය 2023 අප්‍රේල් මස සිට විවිධ දැනුවත් කිරීමේ වැඩ සටහන්/ වැඩමුළු සඳහා යොදාගත් බව. | සම්පත් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිවැය රු.මිලියන 58 ක් වූ විශ්වවිද්‍යාලයේ අංශ 05 ක කටයුතු සම්බන්ධයෙන් මොඩියුල වශයෙන් ස්ථාපිත කර තිබුණු කළමනාකරණ තොරතුරු පද්ධතියේ (omis) අඩුපාඩු පැවතීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට නව කළමනාකරණ තොරතුරු පද්ධතියක් (new omis) ස්ථාපිත කිරීම සඳහා රු.48,864,381 ක් වැය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නව කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි . | මෙම New OMIS පද්ධතිය යාවත්කාලීන කර කෙටිකාලීන පාඨමාලා සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් භාරගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා ස්ථාපනය කරමින් පවතින අතර එහි මූලික තත්ත්ව සහතිකකරන හා පරීක්ෂණ (Quality Assurance and Testing) කටයුතු අවසන් කර ඇති බව. | කළමනාකරණ තොරතුරු පද්ධතිය කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |